(© Nekath.lk - Download By http://www.nekath.lk)

# *2020 අලුත් අවුරුදු උදාව රටට - ලෝකයට කොහොම ද?*

රටට - ලෝකයට බලපාන ඉදිරි තත්ත්වයන් පිළිබඳව අනාවැකි ප්‍රකාශ කිරීම වසර ගණනාවක් තිස්සේ අප විසින් සිදුකරනු ලබයි.මේ සඳහා ජ්‍යොතීර්වේදය පදනම් කොට ගත් මූලධර්ම යොදා ගන්නා අතර මෙසේ අනාවැකි ප්‍රකාශ කිරීම තවමත් පර්යේෂණ මට්ටමක පවතී.මෙම ආයතනය සාම්ප්‍රදායික ජ්‍යොතිෂ්‍යවේදී භූමිකාවෙන් සැම විටම බැහැර වන අතර අපට අවැසි වනුයේ,මිත්‍යාව ඉවතලා මෙම විෂය තුළ යම් විද්‍යාත්මක සත්‍යයක් ඇත්නම්,එය සමාජ ගත කිරීමටයි.විද්‍යාත්මක න්‍යාය ඔස්සේ යමින් පරීක්ෂණ,නිරීක්ෂණ හා නිගමන තුළින් මේ විෂය හැදෑරීම අපගේ ඒකායන අරමුණයි. අප කිසිවිටෙකත් හිතලු හෝ අනුමානයන් ගෙනහැර නොදක්වයි.සියල්ල සාධක සහිතව සනාථ කිරීමට පැරණි ලිඛිත මූලාශ්‍ර අප සතුව ඇත. ඒ අනුව 2019-04-14 දින සිට 2020-04-13 දින දක්වා කාල පරාසය තුළ ඇති විය තත්ත්වයන් ගිය වසර ආරම්භයේ දී දක්වන ලදී. එකී කාලය තුළ ***ශ්‍රී ලංකාවේ යම් යම් ස්ථානවල සිදුවන පිපිරීම් හේතුවෙන් ජන සංහාර ඇති වන බවත් පැතිර යන රෝගයක් හේතුවෙන් මහජන ව්‍යසන ඇතිවන බවත් යුධ-නාවික-වෛද්‍ය සේවයේ නියුතු අයට අසුබ කාලයක් උදාවන බවත් අධ්‍යාපනය කෙරෙහි අසුබ තත්ත්වයන් නිර්මාණය වන බවත් පෙන්වා දී ඇත.*** තවත් බොහෝ කරුණු එහි අන්තර්ගත අතර සත්‍යාසත්‍යතාව ඔබ ම විමසා බලත්වා! මේ ලිපිය තුළින් 2020-04-13 දින සිට 2021-04-14 දින දක්වා රටෙහි සහ ලෝකයෙහි ඇතිවිය හැකි සංසිද්ධීන් සාකච්ඡා කෙරෙයි.මෙම ලිපිය සම්පාදනය සඳහා පහත සඳහන් ජ්‍යොතිෂ්‍යමය සිද්ධාන්ත යොදා ගෙන ඇත.

- ❖ සූර්යග්‍රහණ,චන්ද්‍රග්‍රහණ සහ ග්‍රහ යුද්ධවල බලපෑම
- ❖ අලුත් අවුරුදු උදා ලග්නය සහ ග්‍රහචාරය
- ❖ කුම්භ ලග්න හිමි ලංකා කේන්ද්‍රය සහ ග්‍රහචාරය

## සූර්යග්‍රහණ,චන්ද්‍රග්‍රහණ සහ ග්‍රහ යුද්ධවල බලපෑම

2019-12-26 දින සිදු වූ සූර්යග්‍රහණය,එහි මධ්‍යය අවස්ථාවේ දී ධනු රාශියත් දෙට නැකතත්, 2020-01-11 දින සිදු වූ ඡායා චන්ද්‍රග්‍රහණය,එහි මධ්‍යය අවස්ථාවේ දී මිථුන රාශියත් පුනාවස නැකතත් නියෝජනය කරයි.මෙම වර්ෂය තුළ ග්‍රහ යුද්ධ නමයක් (09) සිදුවන අතර එයින් ශනි,නැප්චූන්,යුරේනස් සහ අඟහරු යන පාප ග්‍රහයන්ට අවස්ථා හයක දී (06) ජය ලැබෙයි.

## *අලුත් අවුරුදු උදා ලග්නය සහ ග්‍රහචාරය*

| | | |
|---|---|---|
| කේ ච<br>ගුකුශ | 1 | 12<br>11 |
| 4 | වෘශ්චික<br>ලග්නය | 10 |
| බු<br>ර | ශු | 9<br>රා |

2020-04-13 වන දින ප.ව.08:23 ට නව වර්ෂය උදාවෙයි.අඟහරුට අයත් වෘශ්චික ලග්නයත් කටක නවාංශකයත් පවතින අතර පුවසල නැකතේ පළමු පාදය නියෝජනය වෙයි.සිකුරුගේ සිකුරු අතුරු දශාව පවතී.

(© Nekath.lk - Download By http://www.nekath.lk)

(© Nekath.lk - Download By http://www.nekath.lk)

***කුම්භ ලග්න හිමි ලංකා කේන්ද්‍රය සහ ග්‍රහචාරය***

| | | |
|---|---|---|
| 2<br>රා | ශු<br>බු | ර<br>11 |
| 4 | කුම්භ<br>ලග්නය | ගු<br>ච |
| 5<br>ශ | කු | කේ<br>8 |

2020-04-11 දින දක්වා රාහු මහ දශාවේ රාහු අතුරු පවතී.එදින සිට 2022-09-05 දින දක්වා රාහු මහ දශාවේ ගුරු අතුරු දශාව ලබයි. 2020-03-29 දින දක්වා ගුරු නීචව දොළොස්වැන්න වූ මකරයේ ගමන් කරයි. එදින සිට 2020-07-02 දින දක්වා ගුරු ධනුවේ ගමන් කොට නැවත මකරයට යයි.

තව දුරටත් ලෝකය තුළ රෝබිය,ගිනිබිය,දුර්භික්ෂබිය ඇති වෙයි. රාජ්‍යය නායකයන් අතර අවිශ්වාසයන් සහ දැඩි වෛර සහගත සිතුවිලි ඇති වේ. ආදායම් මාර්ග ද මුදල් හුවමාරුව හා තැන්පත් කිරීම් ද දුර්වල මට්ටමකට පැමිණේ.

01.ඉන්දියාව,ඇප්ගනිස්ථානය,ග්‍රීසිය,මෙක්සිකෝව,බල්ගේරියාව යන රටවලට ගින්නෙන් දරුණු අනතුරු ඇතිවෙයි.යුද්ධ හා ත්‍රිවිධ හමුදාවට බලවත් පීඩා ඇති කරයි.

02.ප්‍රංශය,ස්විට්සර්ලන්තය,එංගලන්තය,ඩෙන්මාර්කය,ජර්මනිය,පලස්තීනය,සිරියාව,ජපානය යන රටවල මහජන විප්ලව, දේශපාලන ප්‍රතිසංස්කරණ, අවනීතික ක්‍රියා,සෞඛ්‍යය පිරිහීම සිදුවේ.

03.ස්පාඤ්ඤය,හංගේරියාව,ඕස්ට්‍රේලියාව,අරාබිය,මැඩගස්කරය යන රටවල සෙම් ආශ්‍රිත දරුණු රෝග ව්‍යාප්තියක් ද දරුණු ජල විපත් සහ භූ චලන ද ඇති කරයි.

04.***ශ්‍රී ලංකාව***,ස්වීඩනය, පෝලන්තය යන රටවල මහජන කැළඹිලි සහ කුමන්ත්‍රණ අධික වෙයි. මහජන නියෝජිතයන් අතර බරපතල ලෙස රහසිගත ක්‍රියා සිදුවෙයි. නින්දාසහගත දේ වැඩි වශයෙන් සිදුවෙයි. මහජනයා සම්බන්ධ අලුත් නීති සම්පාදනය වේ.පාර්ලිමේන්තුව,ඇමති මණ්ඩලය,ආර්ථිකය,විදෙස් ප්‍රතිපත්ති යන අංශ කෙරෙයි අහිතකර තත්ත්වයන් නිර්මාණය වේ.මීට අමතරව ආණ්ඩුවේ ප්‍රධාන සේවකයෙකුගේ මරණය සිදු වීම ද ස්ත්‍රී දූෂණ සහ අපරාධ බහුල වීම ද රසායනික පිපිරීම් සිදු වීම ද ස්වභාවික විපත් පැමිණීම ද නාවික හමුදාවට පීඩා ද බහුල කරනු ඇත.ආගම හා අධ්‍යාපනය සම්බන්ධ වාද සහ ගැටළු පැන නැගෙයි.

05.උතුරු සිරියාව,ඇමරිකාව,නෝර්වේ,ක්වීන්ස්ලන්ඩ් යන රටවල් ගනු ලබන තීරණ හමුවේ,එම රටවල් ලෝකාපවාදයට ලක්වෙයි.එම රටවල සෞඛ්‍යය,දේශපාලනය හා සමාජය භයානක අන්දමින් අවුල් සහගත වෙයි.

06.දැනට පවතින කොරෝනා වෛරස් තත්ත්වය සඳහා නිශ්චිත ප්‍රතිකාරයක් හමු නොවන අතර පුද්ගල ප්‍රතිශක්තිය හා සොබා දහමේ නියමය පරිදි 2020-07-15 දිනෙන් ආරම්භව 2020-09-15 දින වන විට ක්‍රමානුකූලව ලොවෙන් පහව යනු ඇත.

**උපුල් දොඹේපොල,**
**පුරාණ අන්තරීක්ෂ විද්‍යා ගවේෂක.**
**071-9497975 / 076- 5397975 / 045-4550648**
**info@nekath.lk**
**www.nekath.lk**

(© Nekath.lk - Download By http://www.nekath.lk)